සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 11 | ඉතිහාසය | 3 | 7. ලෝකයේ කැපී පෙනෙන විප්ලව |



සැකසුම: කේ. යූ. ජී. අයි. යූ. කාරියවසම්
බප/හො/සාගරපලන්සූරිය ම.වි


ඇමෙරිකන් නිදහස් සටන


ALASKA
(USA)
EUROPE
-->
CANADA
EAST ASIA
<--
UNITED STATES
OF AMERICA
MEXICO
and
CENTRAL AMERICA
CARIBBEAN
OCEANIA
TimeMaps
SOUTH AMERICA

# හැඳින්වීම

- කිසියම් ක්ෂේත්‍රයක් තුළ කෙටි කාලයක දී ඇති වන ප්‍රබල වෙනස්වීමක් විප්ලවයක් ලෙස හැඳින්වේ.

  උදා :- කාර්මික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස කාර්මික විප්ලවය

  යුරෝපයේ ආගමික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස ආගමික විප්ලවය

# ඇමෙරිකන් නිදහස් සටන

- ඇමෙරිකන් ජනපදවාසීන් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් නිදහස ලබා ගැනීම සඳහා ගෙන ගිය සටන ඇමෙරිකන් නිදහස් සටන වශයෙන් හඳුන්වයි.


# යුරෝපීයයන් ඇමෙරිකාවේ ජනපද පිහිටුවීමට බලපෑ හේතු

- යුරෝපා රටවල පැවති රෝමානු කතෝලික හා රෙපරමාදු ආගමික ගැටුම් නිසා ආගමික නිදහස පතා නව ප්‍රදේශ වෙත යුරෝපීය ජනයා ඇදී යාම.

- නව ප්‍රදේශවල ඉඩකඩම් අත්පත් කර ගැනීමෙන් ජන ජීවිතය සෞභාග්‍යමත් කර ගැනීමට යුරෝපීයයන් යොමු වීම.

- කීර්තිය හා ධනය වර්ධනය කර ගැනීමේ අරමුණෙන් යුරෝපා රටවල පාලකයන් නව ප්‍රදේශ සොයා ජනාවාස පිහිටුවා ගැනීමට ලබා දුන් ධෛර්යය හා උනන්දුව.

# බ්‍රිතාන්‍යයන් විසින් ඇමෙරිකාවේ පිහිටුවාගත් ජනපද




01.වර්ජිනියා
02. මැසචුසෙට්ස්
03. නිව්යෝර්ක්
04. නිව්හැම්ෂයර්
05. මේරිලන්ඩ්
06. කනෙක්ටිකට්
07. රෝඩ් දිවයින
08. ඩෙලවෙයාර්
09. උතුරු කැරොලිනා
10. නිව් ජර්සි
11. දකුණු කැරොලිනා
12. පෙන්සිල්වේනියා
13. ජෝර්ජියා

# ඇමෙරිකන් ජනපද හා බ්‍රිතාන්‍ය පාලනය

- බ්‍රිතාන්‍ය සමාගම් හා විවිධ පුද්ගලයන්ගේ මැදිහත්වීම මත උතුරු ඇමෙරිකානු ප්‍රදේශවල ජනපද පිහිටුවීම.

- ආණ්ඩුකාරවරයෙකු සහ ඒ ඒ ජනපදයෙන් තෝරා ගත් ව්‍යවස්ථාදායක සභාවක් ඔස්සේ පාලනය මෙහෙයවීම.

- ජනපදවාසීන් ප්‍රංශවරුන්ගේ සහ රතු ඉන්දියන්වරුන්ගේ තර්ජනවලට මුහුණ දීම.

# සත් අවුරුදු යුද්ධය (ක්‍රි.ව. 1756 - 1763)

ක්‍රි.ව. 1756 - 1763 කාලයේ ප්‍රංශය හා බ්‍රිතාන්‍ය අතර යුද්ධයක් පැවතුණි. එය සත් අවුරුදු යුද්ධය නමින් හැඳින්වුණි. මෙම යුද්ධයෙන් ප්‍රංශය පරාජයට පත් විය.



# නිදහස් සටනට බලපෑ හේතු

- ජනපදවල නිපදවන ලද දුම්කොළ, සීනි, කපු, මී ඉටි, තිරිඟු, තඹ වැනි ද්‍රව්‍ය බ්‍රිතාන්‍යයන්ට පමණක් ලබා දිය යුතු වීම.

- භාණ්ඩ අපනයනයේ දී බ්‍රිතාන්‍ය හරහා අදාළ භාණ්ඩ වෙනත් රටවලට යැවිය යුතු වීම.

- බ්‍රිතාන්‍ය අගමැති ජෝර්ජ් ග්‍රෑන්විල්ගේ පාලන සමයේ දී සීනි, මුදල් නෝට්ටු සහ මුද්දර ආදිය සඳහා බදු පනත් පැනවීම.

# ඇමෙරිකන් විප්ලවයට තුඩු දුන් හේතු

- ඇමෙරිකන් ජනපදවාසීන් කාලයක් තිස්සේ බ්‍රිතාන්‍ය මැදිහත්වීම අඩු වශයෙන් පැවති පාලනයකට හුරු වී සිටීම.
- බ්‍රිතාන්‍ය අනුගමනය කළ තම රටට වාසිදායක ආර්ථික ප්‍රතිපත්තිය
- ජනපදවාසීන්ගේ සිතුම් පැතුම් හා ආකල්ප බ්‍රිතාන්‍ය පාලකයන් විසින් නිසි ලෙස අවබෝධ කරගෙන නොසිටීම.
- වර්ෂ 1763 න් පසුව පැනවූ අණ පනත් හා නව බදු වර්ග

# ඇමෙරිකන් විප්ලවයට තුඩු දුන් හේතු

- ජනපදවාසීන්ගේ සාධාරණ සටන් මර්දනය කිරීමට බ්‍රිතාන්‍ය කටයුතු කිරීම.

- නිදහස පිළිබඳ ජනපද වැසියන් තුළ ඇති වූ උනන්දුව

# නිදහස් සටන

- නියෝජිතයන් නැතිනම් බදුත් නැත යන සටන් පාඨය යටතේ නිදහස් සටන මෙහෙයවීම.


- ජනපදවාසීන් බ්‍රිතාන්‍ය භාණ්ඩ වර්ජනය කිරීමට කටයුතු කිරීම.

- ජනපද 12 ක නියෝජිතයන් සහභාගීවෙමින් පිලඩෙල්පියා සම්මේලනය පැවැත්වීම.

- මහාද්වීපික හමුදාවේ අණ දෙන නිලධාරී වශයෙන් ජෝර්ජ් වොෂිංටන් තෝරා පත් කර ගැනීම.

# බොස්ටන් තේ සාදය

1773 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී බොස්ටන් වරායේ නවතා තිබූ තේ නැවකට වෙස්වලාගෙන ඇතුළු වූ බොස්ටන් වැසියන් පිරිසක් එහි තිබූ තේ පෙට්ටි 342 ක් මුහුදට විසි කර දැමූහ. බොස්ටන් තේ සාදය නමින් ප්‍රචලිත මෙම සිදුවීම ඇමෙරිකන් විප්ලවයේ ආරම්භය ලෙස සැලකේ.



# නිදහස් සටන

- 1776 වර්ෂයේ ජූලි 04 වැනි දින ඇමෙරිකන් නිදහස් ප්‍රකාශය නිකුත් කිරීම.

- වර්ෂ 1783 දී අත්සන් කළ පැරිස් සාම ගිවිසුමෙන් ඇමෙරිකාව නිදහස් ස්වාධීන රාජ්‍යයක් ලෙස බ්‍රිතාන්‍ය විසින් පිළිගැනීම.


- වර්ෂ 1789 දී සම්මත කර ගත් නව ව්‍යවස්ථාවෙන් ජෝර්ජ් වොෂිංටන් ඇමෙරිකාවේ ප්‍රථම ජනාධිපතිවරයා වීම.

# නිදහස් සටනේ ප්‍රතිඵල

- ❖ ඇමෙරිකා එක්සත් ජනපදය නම් ස්වාධීන රාජ්‍යය බිහි වීම.

- ❖ සමස්ත මානව සංහතියට ම නිදහසේ අගය පෙන්වා දුන් අවස්ථාවක් වීම.

- ❖ මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ලොව පුරා උනන්දුවක් ඇති වීම.
- ❖ ලෝකයේ ප්‍රථම ලිඛිත සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බිහි වීම.





ප්‍රංශ විප්ලවය


Iceland
Norway
Sweden
Finland
Russia
Estonia
Latvia
Lithuania
Belarus
United Kingdom
Poland
Ukraine
Germany
Czech Republic
Slovakia
Austria
Hungary
Romania
France
Croatia
Bos. &
Her.
Serbia
Bulgaria
Italy
Portugal
Spain
Greece
Turkey


FRANCE

# ප්‍රංශ විප්ලවය

- 1789 වර්ෂයේ දී ප්‍රංශ රාජාණ්ඩුවට එරෙහිව නැගී සිටි එරට ජනතාව රාජාණ්ඩුව බිඳ දමා නව පාලනයක් පිහිටුවා ගැනීම ප්‍රංශ විප්ලවය නමින් හැඳින්වේ.

- ප්‍රංශ විප්ලවයේ තේමාව වූයේ නිදහස, සමානාත්මතාව සහ සහෝදරත්වය යන්නයි.

# ප්‍රංශ විප්ලවයට බලපෑ දේශපාලන හේතු

- ප්‍රංශ රජවරු සතු වූ අසීමිත ඒකාධිපති බලතල

  උදා - 14 වන ලුවී රජු සහ 16 වන ලුවී රජු යන රජවරු අසීමිත ඒකාධිපති බලතල අයුතු අන්දමින් භාවිතා කිරීම.

- රජු ගත කළ අධික සුඛෝපභෝගී ජීවිතය ජනතා අප්‍රසාදයට බඳුන්වීම.

  උදා - රජු වාසය කළ වර්සෙල්ස් මාලිගය

- රජු සහ සාමාන්‍ය ජනතාව අතර සම්බන්ධතාව දුරස්වීම.

- ප්‍රංශ රාජාණ්ඩුව අතිශය දූෂිතවීම.



14 වන ලූවී රජු



16 වන ලූවී රජු



# වර්සෙල්ස් මාලිගය





වර්සෙල්ස් මාලිගය



# ප්‍රංශ විප්ලවයට බලපෑ සමාජ හේතු

- ප්‍රංශ රජ පවුල, පූජකයන් සහ රදලයන් ප්‍රංශ සමාජය තුළ වැඩි වරප්‍රසාද භුක්ති විඳීම.

- ප්‍රංශයේ ඉඩම්වලින් වැඩි ප්‍රමාණයක් රදලයන් සතු විය. රදලයන් භුක්ති විඳි වරප්‍රසාදවලින් කිහිපයක් පහත දැක් වේ.
  - රටේ ඕනෑම ස්ථානයක දඩයම් කිරීමට ඔවුන්ට අයිතියක් තිබුණි.
  - රදලයන් සතු ධාන්‍ය ඇඹුරුම්හල් වයින් පෙරන යන්ත්‍ර පෝරණු ආදියෙන් ගොවියන් සිය අවශ්‍යතා ඉටු කර ගත යුතු වූ අතර ඒ සඳහා අධික ගාස්තු අය කිරීමෙන් රදලයන්ට විශාල ආදායමක් ලැබුණි.

- ගොවීන්ගේ ඉඩම්වලින් බදු අය කර ගැනීමේ අයිතිය රදළයන් සතු විය.
- රජයට බදු ගෙවීමෙන් රදළයෝ නිදහස් වූහ.

- ප්‍රංශ මධ්‍යම පංතියට සමාජයේ නිසි තැනක් නොලැබීම.
- ප්‍රංශ ගොවි ජනතාව දැඩි පීඩාවකට ලක් වීම.

# ප්‍රංශ විප්ලවයට බලපෑ ආර්ථික හේතු

- ප්‍රංශ භාණ්ඩාගාරය සම්පූර්ණයෙන් ම බංකොලොත් වී තිබීම.
- අසාධාරණ බදු ක්‍රමය

  උදා - ටේල්, ගැබෙල්, කැපිටේෂන්



බදු බර



යුධ ගැටුම් බහුලවීම

# ප්‍රංශ විප්ලවයට බලපෑ දාර්ශනික හේතු


- මොන්ටෙස්කියු, වෝල්ටෙයාර් සහ රූසෝ යන දාර්ශනිකයන්ගේ අදහස් විප්ලවය දිරිමත් කරන චින්තනයක් සැපයී ය.

- මොන්ටෙස්කියු නීතියේ සාරය නම් තම කෘතිය මඟින් එක් පුද්ගලයෙකු වටා බලය ඒකරාශී වීම නුසුදුසු බවත් ඉන් ඒකාධිපති පාලනයක් ගොඩනැගෙන බවත් ප්‍රකාශ කළේය.

- වෝල්ටෙයාර් ස්වාධීන මත ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳ ව අදහස් දැක්වීය.

# ප්‍රංශ විප්ලවයට බලපෑ දාර්ශනික හේතු


- රූසෝ සමාජ සම්මුතිය නම් සිය ග්‍රන්ථය මගින් ජනතා ස්වාධිපත්‍ය පිළිබඳ සංකල්පය ඉදිරිපත් කළේ ය.



වෝල්ටෙයාර්



මොන්ටෙස්කායු



රුසෝ

# විප්ලවය


- බදු ප්‍රතිසංස්කරණයක් සිදු කිරීම සඳහා ස්ටේටස් ජෙනරල් සභාව කැඳවීම.

- රදල පංතිය සහ පූජකවරු වෙනම රැස් විය යුතු බව රදලවරු ප්‍රකාශ කිරීම.

- මෙම අර්බුදය හේතුවෙන් සාමාන්‍ය ජනතාව නියෝජනය කළ තුන්වැනි පංතියේ නියෝජිතයෝ වෙනම රැස් වීම.

# විප්ලවය


- එම නියෝජිතයන් ටෙනිස් පිටියකට රැස් වී ප්‍රංශයට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කර මිසක විසිර නොයන බවට දිවුරුම් දුන් අතර එය ටෙනිස් පිටියේ දිවුරුම නම් විය.



ස්ටේටස් ජෙනරල් සභාව



# ටෙනිස් පිටියේ දිවුරුම



බැස්ටීල් බන්ධනාගාරයට පහර දීම

# ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල

- ❖ මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ව ලොව පුරා උනන්දුවක් ඇති වීම.

  ප්‍රංශ විප්ලවවාදීන් විසින් 1791 වර්ෂයේ දී මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයක් එළි දක්වන ලදී.

  (01) සෑම රටවැසියෙකුට ම නීති සම්පාදනය කිරීමේ කාර්යයට සම්බන්ධවීමට අයිතියක් තිබේ.


  (02) සෑම පුරවැසියෙකුට ම නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට හා කැමති ආගමක් ඇදහීමට අයිතිය තිබිය යුතුය.

- ❖ ප්‍රංශ රාජාණ්ඩු ක්‍රමය බිඳ වැටීම.

# ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල

- ප්‍රංශ ගොවි ජනතාවට සහන ලැබීම.
- ප්‍රංශයේ අස්ථාවර දේශපාලන ක්‍රමයක් බිහිවීම.





# රුසියානු විප්ලවය



සාර් පාලනය යටතේ පැවති රුසියානු අධිරාජ්‍යය

# රුසියානු විප්ලවය

- ඒකාධිපති රාජාණ්ඩුව බිඳ දමමින් සමාජවාදී සමාජයක් ගොඩනැගීමේ අරමුණින් 1917 මාර්තු හා ඔක්තෝම්බර් යන මාසවල සිදු වූ විප්ලව දෙක රුසියානු විප්ලවය යනුවෙන් හැඳින්වෙයි.

- රුසියානු විප්ලවයේ තේමාව වූයේ සාමය, ඉඩම් සහ ආහාර යන්නයි.




දෙවන නිකලස් සාර් ඇතුළු රජ පවුල


# රුසියානු විප්ලවයට බලපෑ හේතු

- රුසියාවේ රජ කළ සාර් නමින් හැඳින් වූ රජවරු ජනතාව පෙළමින් බදු අය කර ගනිමින් ගෙන ගිය දූෂිත පාලනය

- වර්ෂ 1905 දී ඇති වූ රාජ්‍ය විරෝධී සටන

- ලෙනින්ගේ නායකත්වයෙන් යුතුව ක්‍රියාත්මක වූ බොල්ෂෙවික් පක්ෂයේ ක්‍රියාකාරකම්

- වර්ෂ 1914 දී ඇරඹි පළමු ලෝක මහා සංග්‍රාමයට රුසියාව මිත්‍ර පාර්ශවයේ ක්‍රියාකාරිකයෙකු වශයෙන් සම්බන්ධවීම


වී. අයි. ලෙනින්


ලියොන් ට්‍රොට්ස්කි

# 1917 මාර්තු විප්ලවය

1917 මාර්තු විප්ලවය ආරම්භ වූයේ රෙදි කම්හලක ඇති වූ වැඩ වර්ජනයකිනි. මේ සඳහා සාර් පාලනයේ හමුදාවෝ ද එක් වූහ. මේ නිසා රජයට ජනතා විරෝධය පාලනය කළ නොහැකි වූ අතර 1917 මාර්තු මාසයේ දී රජුට සිහසුන අත්හැරීමට සිදු විය.කෙරෙන්ස්කි නම් නායකයා ඉන් අනතුරු ව බලයට පැමිණි අතර එහෙත් ඔහුගේ ආණ්ඩුවට රටේ අවශ්‍යතා සඳහා විසඳුම් නොවීය.


БРАТЬЯ МОРИ
БРАТЬЯ
КОРМИТЕ ДѢТЕЙ ЗАЩИТНИКОВЪ РОДИНЫ
ПРИБАВКУ ПАЙКА
СЕМЬЯМЪ СОЛДАТЪ
ЗАЩИТНИКАМЪ СВОБОДЫ
И НАРОДНОГО МІРА.



කෙරෙන්ස්කි

# 1917 ඔක්තෝම්බර් විප්ලවය

මේ අතර ලෙනින්ගේ නායකත්වයෙන් යුත් බොල්ෂෙවික්වරු සෝවියට් මණ්ඩල පිහිටුවමින් ගොවි කම්කරු රජයක් පිහිටුවීමේ අරමුණින් කටයුතු කළහ. විප්ලවය ආරම්භ වන අවධියේ දී මෙන්ෂෙවික්වරු සහ බොල්ෂෙවික්වරු වශයෙන් දේශපාලන කණ්ඩායම් දෙකක් සිටි අතර මෙන්ෂෙවික්වරු ජනතා ප්‍රශ්න විසඳීමට යම් යම් ප්‍රතිසංස්කරණ පමණක් සෑහේ යැයි කල්පනා කළ මුත් බොල්ෂෙවික්වරුන්ගේ අදහස වී පැවතියේ ධනවාදී සමාජ ක්‍රමය සහමුලින් ම බිඳ දමා කොමියුනිස්ට් අදහස් මත පදනම් වූ පන්ති රහිත සමාජයක් ගොඩ නැගිය යුතු බවයි.

# 1917 ඔක්තෝම්බර් විප්ලවය

මේ අනුව තාවකාලික ආණ්ඩුවට එරෙහිව නැගී එන මහජන විරෝධය දුටු ලෙනින් "මේ අවස්ථාවේ අපි බලය අල්ලා නොගතහොත් ඉතිහාසය අපට සමාව නොදෙනු ඇතැයි" ප්‍රකාශ කළේය. ඒ අනුව ඔක්තෝම්බර් මස විප්ලවය ඇරඹුණි. සන්නද්ධ භට කණ්ඩායම් රජයේ ප්‍රධාන මධ්‍යස්ථාන අල්ලා ගත් අතර බලවත් සටනකින් තොරව ම විප්ලවය ජය ගැනීමට ලෙනින් ප්‍රමුඛ බොල්ෂෙවික්වරුන්ට හැකියාව ලැබුණි.



Mensheviks



Bolsheviks







# රුසියානු විප්ලවයේ ප්‍රතිඵල

- ❖ බොල්ෂෙවික්වරුන්ගේ රජයක් පිහිටුවීම.
- ❖ රුසියාවට සාමය උදාවීම
- ❖ නව ආණ්ඩුව විසින් පෞද්ගලික ඉඩම් අයිතිය අහෝසි කිරීම.
- ❖ සියලු ම කර්මාන්තශාලා, බැංකු සහ ගමනාගමනය ජන සතු කිරීම.
- ❖ රුසියාව සමාජවාදී දර්ශනය පිළිගත් රටක් බවට පත්වීම.

# සමාජවාදී දර්ශනය

සමාජවාදය යනු කොමියුනිස්ට්වාදී දර්ශනය අනුව සමාජය සතු ධන සම්පත් පිළිබඳ පොදු අයිතිය පිළි ගැනීම, සෑම පුරවැසියෙකුට ම තම කුසලතා ඉහළ නංවා ගැනීමට සමාන ඉඩක් ලබා දීම, නිෂ්පාදන ඵල සියලු දෙනාට ම සමානව බෙදී යාම යන මූලධර්ම පිළිගත් දේශපාලන දර්ශනයකි.

ඒ අනුව,

- පුද්ගල අවශ්‍යතාවලට වඩා පොදු දියුණුවට හා පොදු අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දීම.
- සමාජ අසාධාරණකම් හා අසමානතා නැති කිරීම.

# සමාජවාදී දර්ශනය

- සමාජයේ පන්ති විෂමතා නැති කර සියලු දෙනාට සහෝදරත්වයෙන් සලකන උසස් මානව සමාජයක් ගොඩනැගීම ආදිය සමාජවාදී දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණ වේ.

පැරණි ලෝකයේ පැවති සමාජවාදී රටවල්

උදා- චීනය, නැගෙනහිර ජර්මනිය, දකුණු කොරියාව, කියුබාව


U. S. S. R.
www.theodora.com/maps


The Five Communist Countries of the World
Cuba
Republic of Cuba, est. 1961
North Korea
Democratic People's Republic of Korea, est. 1948
Vietnam
Socialist Republic of Vietnam, est. 1976
Laos
Lao People's Democratic Republic, est. 1975
China
People’s Republic of China, est. 1949

**සවියෙන් පෙරට අපි එකට**
**e- ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 11 | ඉතිහාසය | 3 | 7. ලෝකයේ කැපී පෙනෙන විප්ලව - ඇගයීම |

**සැකසුම: කේ. යූ. ජී. අයි. යූ. කාරියවසම්**
**බප/හො/සාගරපලන්සූරිය ම.වි**

01. ඇමෙරිකන් නිදහස් සටන කෙටියෙන් හඳුන්වන්න.
02. යුරෝපීයයන් ඇමෙරිකාවේ ජනපද පිහිටුවීමට බලපෑ හේතු දෙකක් ලියා දක්වන්න.
03. බ්‍රිතාන්‍ය අගමැති ජෝර්ජ් ග්‍රැන්විල්ගේ කාලසමයේ දී පැන වූ බදු පනත් තුනක් නම් කරන්න.
04. ඇමෙරිකන් නිදහස් සටනේ ප්‍රතිඵල මොනවාද?
05. ප්‍රංශ විප්ලවයේ තේමා පාඨය කුමක්ද?
06. මහජනතාව පීඩාවට පත් කළ බදු වර්ග තුනක් නම් කරන්න.
07. ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල හතරක් ලියා දක්වන්න.
08. රුසියානු විප්ලවයට බලපෑ හේතු තුනක් නම් කරන්න.
09. රුසියානු විප්ලවයට නායකත්වය දුන් නායකයින් දෙදෙනෙකු නම් කරන්න.
10. සමාජවාදී දර්ශනයේ ලක්ෂණ මොනවාද?

සවියෙන් පෙරට අපි එකට
*e*- ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 11 | ඉතිහාසය | 3 | 7. ලෝකයේ කැපී පෙනෙන විප්ලව - පිළිතුරු |

**සැකසුම: කේ. යූ. ජී. අයි. යූ. කාරියවසම්**
**බප/හො/සාගරපලන්සූරිය ම.වි**

01. ඇමෙරිකන් ජනපදවාසීන් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් නිදහස ලබා ගැනීම සඳහා ගෙන ගිය සටන ඇමෙරිකන් නිදහස් සටන වශයෙන් හඳුන්වයි.

02. * යුරෝපා රටවල පැවති රෝමානු කතෝලික හා රෙපරමාදු ආගමික ගැටුම් නිසා ආගමික නිදහස පතා නව ප්‍රදේශ වෙත යුරෝපීය ජනයා ඇදී යාම.
* නව ප්‍රදේශවල ඉඩකඩම් අත්පත් කර ගැනීමෙන් ජන ජීවිතය සෞභාග්‍යමත් කර ගැනීමට යුරෝපීයයන් යොමු වීම.

03. සීනි, මුදල් නෝට්ටු සහ මුද්දර

04. * ඇමෙරිකා එක්සත් ජනපදය නම් ස්වාධීන රාජ්‍යය බිහි වීම.
* සමස්ත මානව සංහතියට ම නිදහසේ අගය පෙන්වා දුන් අවස්ථාවක් වීම.
* මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ලොව පුරා උනන්දුවක් ඇති වීම.
* ලෝකයේ ප්‍රථම ලිඛිත සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බිහි වීම.

05. නිදහස, සමානාත්මතාව සහ සහෝදරත්වය

06. ටේල්, ගැබෙල්, කැපිටේෂන්

07. * මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ව ලොව පුරා උනන්දුවක් ඇති වීම.
* ප්‍රංශ රාජාණ්ඩු ක්‍රමය බිඳ වැටීම.
* ප්‍රංශ ගොවි ජනතාවට සහන ලැබීම.
* ප්‍රංශයේ අස්ථාවර දේශපාලන ක්‍රමයක් බිහිවීම.

08.

* රුසියාවේ රජ කළ සාර් නමින් හැඳින් වූ රජවරු ජනතාව පෙළමින් බදු අය කර ගනිමින් ගෙන ගිය දූෂිත පාලනය

* වර්ෂ 1905 දී ඇති වූ රාජ්‍ය විරෝධී සටන

* ලෙනින්ගේ නායකත්වයෙන් යුතුව ක්‍රියාත්මක වූ බොල්ෂෙවික් පක්ෂයේ ක්‍රියාකාරකම්

09. වී.අයි. ලෙනින්, ලියොන් ට්‍රොට්ස්කි

10. * පුද්ගල අවශ්‍යතාවලට වඩා පොදු දියුණුවට හා පොදු අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දීම.

* සමාජ අසාධාරණකම් හා අසමානතා නැති කිරීම.

* සමාජයේ පන්ති විෂමතා නැති කර සියලු දෙනාට සහෝදරත්වයෙන් සලකන උසස් මානව සමාජයක් ගොඩනැගීම.